# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2154/56 – 2019 දෙසැම්බර් 21 වැනි සෙනසුරාදා – 2019.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරන්ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 834, කුරුණෑගල නගරය ඊසාන වසම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුරුණෑගල නගරය 5 වැනි කොට්ඨාසය, පොල්අත්තාපිටිය (කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක KU/KRN/ 2017/796 හා 2019.09.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්.

01. **කැබලි අක්ෂර 'ඒ' – වරි. අංක 75, දඹුල්ල පාර – ප්‍රමාණය: හෙක්. 0.2169**

උතුරට: මාර්ගය සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ දකුණු වැව රවුම පාර; බටහිරට: දකුණු වැව රවුම පාර සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර බී' – ප්‍රමාණය: හෙක්. 0.0136**

උතුරට: මාර්ගය සහ කු/ලක්දස් ද මැල් විද්‍යාලය, හිමිකම් කියන පීපල්ස් පාර්ක්; නැගෙනහිරට: කු/ලක්දස් ද මැල් විද්‍යාලය, හිමිකම් කියන පීපල්ස් පාර්ක් සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2014/PC/351.
2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 -276


1A – G31696 – 21(2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*